# සංකාරා හින්දු සංස්කෘතියට අමාවකි

සිංහල මාධ්‍යයෙන් නිපදවෙන සිංහල බෞද්ධ විරෝධී චිත්‍රපටි සඳහා පමණක් ජාත්‍යන්තර චිත්‍රපටි උළෙලවලදී තෑගි ලැබෙන බවට කරන ප්‍රකාශ අන්තගාමී යැයි මෑතක දී ප්‍රසිද්ධියට පත් එක් තරුණයකු පවසා තිබෙනු දක්නට ලැබිණි. ඇතැම්විට සිංහල බෞද්ධ විරෝධී නොවන චිත්‍රපටිවලට ද එවැනි ජාත්‍යන්තර සිනමා උළෙලවල දී තෑගි ලැබෙනවා විය හැකි ය. එහෙත් ජාත්‍යන්තර සිනමා උළෙලවල දී තෑගි දිනාගෙන ඇති චිත්‍රපටිවලින් ඉතා වැඩි ප්‍රමාණයක් සිංහල බෞද්ධ විරෝධී වෙයි. එයට හේතුව චිත්‍රපටි උළෙල සංවිධානය කරන්නවුන් බොහෝ විට සිංහල බෞද්ධ විරෝධී බටහිර නූතනත්ව මතවාද දරන්නවුන් වීම ය. එසේත් නැත්නම් ඔවුහු හින්දු මතවාදී ආධිපත්‍යකින් ගාරතයේ චිත්‍රපටි උළෙළ සංවිධානය කරන්නෝ වෙති.

ඒ චිත්‍රපටි උළෙල සංවිධානයකරන්නවුන් මතවාදී ව සිංහල බෞද්ධ විරෝධී වීම කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් නො වෙයි. විවිධ ඓතිහාසික හා දේශපාලනික හේතු නිසා ඒ එසේ වෙයි. අද ලෝකයේ මතවාදී ආධිපත්‍යය ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට වීම එයට එක් හේතුවකි. දැනුම් ආධිපත්‍යය ඇත්තේ ඒ සංස්කෘතියට ය. භාරතය එක් පැත්තකින් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට යටවෙමින් සිටින අතර අනෙක් පැත්තෙන් වෛදික හින්දු සංස්කෘතිය විසින් මෙහෙයවනු ලැබෙයි. භාරතීයයෝ සමස්තයක් ලෙස ගත්කල පැරණි අනාර්ය (ද්‍රවිඩ නොව) සංස්කෘතීන්ට විරුද්ධ වෙති. ඒ එකක්වත් කුමන්ත්‍රණයක් නිසා වූවක් නො වෙයි. ලෝකයේ කටයුතු සිදුවන්නේ ඒ ආකාරයට ය. එහෙත් එය ඊනියා යථාර්ථයක් ද නොවන බව අවබෝධ කරගත යුතු ය. ඉතහ සඳහන් තරුණයාට මේ එකක්වත් නොතේරෙන බව පැහැදිලි ය. එවැන්නෝ ඊනියා ප්‍රබුද්ධයෝ ම පමණක් වෙති.

ජාත්‍යන්තර චිත්‍රපටි උළෙලක දී තෑගි හා සම්මාන පිරිනැමීම සඳහා චිත්‍රපටි තෝරන්නේ ඒවාහි හුදු සිනමාරූපීබව සලකා නො වෙයි. ඒ චිත්‍රපටිවලින් අසවලා, අසවල් දේ නිරූපණයවන්නේ යැයි අදාළ ජූරිසභාව පවසයි. විචාරකයෝ ද එවැනි නිරූපණ කතා කියති. මෙහි දී සිදුවන්නේ කුමක් ද? යම් පණිවුඩයක් ඒ ඒ ජූරි සභාවට ද විචාරකයන්ට ද අදාළ චිත්‍රපටියෙන් යැවෙයි. පණිවුඩ නො යැවෙන්නේ යැයි කෙනෙක් කීව ද පණිවුඩයක් නොමැති කලා කෘතියක් නැත්තේ කලා කෘතියෙන් සාධාරණීකරණයක් සිදුවන බවට බටහිර යථාරාථවාදීන්ගේ සිත්වල ඇති බැවිනි.

පසුගිය කාලයෙහි බටහිර බිහි වූ විවිධ ආකෘතිවලට මුල ඊනියා යථාර්ථවාදයෙන් මිනිස් මනස් හෙළිකිරීමට නොහැකි බව බටහිරයන්ට ද තේරුම් යෑම ය. අධි යථාර්ථවාදය, ඉන්ද්‍රජාලික යථාර්ථවාදය, විකාරරූප කෘති ආදියට හේතුව වෙනත් කිසිවක් නොව ඊනියා යථාර්ථවාදී පොදු ගුණයක් මිනිස් මනස යනුවෙන් ඇති මනස්වලට නැති වීම ය. එලෙස විවිධ යථාර්ථවාදී නොවන ආකෘති බිහිකරන අතර ම ඒවාට යම් යථාර්ථවාදයක් ආරෝපණයකිරීමට ද බටහිරයෝ වගබලාගනිති. අධි යථාර්ථවාදයෙහි ද යම් යථාර්ථවාදයක් ඇති බව ඔවුන්ගේ පිළිගැනීම ය. වෙනත් වචනවලින් කිවහොත් විවිධ යථාර්ථවාද ඇතැයි ඔවුහු දැන් විශ්වාසකරති. අධියථාර්ථවාදය හා ඉන්ද්‍රජාලික යථාර්ථවාදය පමණක් නොව විකාරරූපය ද යථාර්ථ වේ යැයි ඔවුහු විශ්වාස කරති.

ථෙරගී හෝ ථෙරිගීවලින් නිරූපණයවන්නේ ඒ ඒ තෙරුන්වහන්සේගේ හෝ තෙරණියන්වහන්සේගේ පැරණි අත්දැකීමක් මිස පොදුගුණයක් නො වෙයි. ඒ ඒ අය කිනම් වංශයක උපත ලැබී ද යන්නවත් පාඨකයාට අදාළ නො වෙයි. පාඨකයා ඒ බව දැනගැනීමටවත් නො වෙහෙසෙයි. අවශ්‍ය නම් යමකුට මෙහි දී ඒ සෑම චරිතයකට ම පාහේ අදාළ ගුණයක් ඇති බවත් ඒ අන්කිසිවක් නොව ඇලීම් හා බැඳීම්වලින් නිදහස්වීම බවත් කිව හැකි ය. එහෙත් ඒ පොදු ගුණය එපමණකට සීමාවෙයි. ඒ ඒ අයගේ ඇලීම් විවිධාකාර වෙයි. ඒ ඇලීම් එක් එක් ජනවර්ගය, වංශය, කුලය ආදී වශයෙන් වර්ගීකරණය නො වෙයි. ඒ කෘතිවලින් එවැනි ජනවාර්ගික පණිවුඩයක් පාඨකයාට නො ලැබෙයි.

එහෙත් වර්තමාන කෙටිකතාවකින්, නවකතාවකින්, නාට්‍යයකින්, චිත්‍රපටියකින් හෝ වෙනත් එවැනි කලාකෘතියකින් එලෙස ජාතියකින්, ජන්මයකින් ස්වාධීන වූ පුද්ගලයකු දැකගැනීමට නො හැකි ය. කලාකෘතියක් නිර්මාණයවන්නේ ම යම්කිසි සංස්කෘතියක ය. කලාකෘතියට පසුබිම්වන චරිතවලට ආවේණික සංස්කෘතික ලක්ෂණ වෙයි. කලාකෘතියකින් තවත් මිනිසකු හෝ ගැහැණියක හෝ යන හැඟීමක් අද නො ලැබෙයි. ථෙරිගී හි තෙරණියක යනු තවත් තෙරණියක

© Prof. Nalin De Silva

පමණක් වෙයි. එහෙත් සංකාරා චිත්‍රපටියෙහි ඇත්තේ සිංහල බෞද්ධ භික්ෂූන්වහන්සේ නමකි. අඩුම තරමින් උන්වහන්සේ තවත් ථෙරවාද බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් නො වෙයි.

සංකාරා චිත්‍රපටිය විවේචනයකරන යථාර්ථවාදීන් ද ඉල්ලා සිටින්නේ ඒ භික්ෂූන්වහන්සේ තව තවත් සිංහල භික්ෂූන් වහන්සේ නමක බවට පත්කිරීමට ය. කැළණිය විශ්වවිද්‍යාලයෙහි උගන්වන කොළඹ ගැන දන්නා භික්ෂූන්වහන්සේ නමක්, එනම් එවැනි අත්දැකීම් ඇති සිංහල භික්ෂූන්වහන්සේ නමක් හැසිරෙන්නේ යැයි සිතන අච්චුවට ඒ භික්ෂූන්වහන්සේගේ චරිතය පත්නොකිරීම පිළිබඳ විවේචකයන්ට ඇත්තේ ඊනියා යථාර්ථවාදී ප්‍රශ්නයකි. ඔවුන්ට අවශ්‍ය කරන්නේ වඩාත් යථාර්ථවාදී සිංහල භික්ෂූන් වහන්සේ නමක් මගින් සිංහල භික්ෂූන්වහන්සේට පහරගැසීමට යැයි සිතිය නොහැකි වුවත් යථාර්ථයක නාමයෙන් සිදුවන්නේ එය ය.

සාමන් රුෂ්ඩි මහතාගේ කෘතිවලට මුස්ලිම් ලෝකයෙන් දැඩි විරුද්ධතාවක් එල්ලවූයේ ඇයි? ඒ කෘතිවලින් ඉස්ලාම් භක්තිකයන්ගේ ඊනියා පොදු ගුණයක් නිරූපණයකිරීමට කතුවරයා උත්සාහ දැරීම නිසා එසේ සිදුවිය. එහෙත් බටහිරයෝ ඒ කෘති උසස් ලෙස පිළිගත්හ. ඒවාට සම්මාන පිරිනැමුහ. එසේ කෙළේ ඒ කෘති හුදෙක් අගනා කලාකෘති වීම නිසා පමණක් ද? නැත. කලින් සඳහන්කරනු ලැබූ ඊනියා ප්‍රබුද්ධ තරුණයා තේරුම් නොගත්තාට ඒ කෘති පිටුපස ඇත්තේ දේශපාලනයකි. ඒ දේශපාලනය සංස්කෘතික ගැටුමක් වෙයි.

ලෝකයේ වසන ඉස්ලාම් භක්තිකයෝ සමස්තයක් ලෙස මේ දේශපාලනය තේරුම්ගත්හ. ඔවුහු රුෂ්ඩි මහතාට එරෙහිව නොයෙකුත් දෑ කළහ. ඔහුට විරුද්ධව මරණ තර්ජනයක් ද එල්ල විය. එහෙත් ඔහු බටහිර සංස්කෘතියෙහි අද සිදුවන ආකාරයට ඇඳුම් මාරුකරන්නාක් මෙන් බිරින්දෑවරුන් මාරුකරමින් බටහිර ජීවත්වීමට සමත්විය. ඉස්ලාම් භක්තිකයනට ඔහුගේ මයිලකටවත් කළහැකි දෙයක් නො වී ය. ඔහුගේ කෘති කිසිම තහනමකට යටත් නොවී ලෝ පුරා විකිණෙයි. රුෂ්ඩි මහතා බටහිරයන්ගෙන් මුස්ලිමුන්ට සිදුවන ගැහැට අළලා කෘති නිර්මාණය කෙළේ නම් ඔහුට කිනම් ප්‍රසිද්ධියක් හිමිවීමට තිබුණි ද?

මෑතක දී ජාත්‍යන්තර චිත්‍රපටි උළෙලවල දී ත්‍යාග හා සම්මාන ලබාගත් සිංහල චිත්‍රපටිවලින් නිරූපණයුවන්නේ සිංහල බෞද්ධයන්ගේ දුර්වලකම්වලට ද වඩා සවිඥානිකව කරන ඊනියා දූෂණ යැයි කීම වැරදි ද? සිංහල බෞද්ධ සොල්දාදුවන්ගේ නොපණත්කම් ඔවුන්ගේ බිරින්දෑවරුන්ගේ ඊනියා කාමුක හැසිරීම් ආදිය ඊනියා කලාවක නාමයෙන් ලෝකය පුරා ප්‍රසිද්ධකිරීමට මේ චිත්‍රපටි අධ්‍යක්ෂකවරු කටයුතු නො කළෝ ද? තම සෙබළ සැමියා සේවයට ගිය වහාම වෙනත් පිරිමින් සමග හැසිරෙන සිංහල බෞද්ධ භාර්යාවන් නිරූපණය කෙළේ හුදු කලාත්මක රස වින්දනය සඳහා පමණක් ද? අධ්‍යක්ෂකවරයා වෙනත් සංසාකෘතියක ගැහැණියක් තම චිත්‍රපටියෙන් නිරූපණය නොකරන්නේ ඇයි?

සංකාරා චිත්‍රපටියෙන් කෙරෙන්නේ ද එවැනි ම දෙයක් නොවුන ද සිංහල බෞද්ධ සංස්කෘතිය හෑල්ලුකිරීමක් බව එහි අන්තර්ගතය පිළිබඳ කෙරෙන කතාබහෙන් පැහැදිලි වෙයි. ථෙරගාථාවල තෙරුන්වහන්සේලා බෞද්ධ වත් පිළිවෙත් අනුගමනය කිරීමෙණ් විමුක්තිය ලැබුවෝ වෙති. එහෙත් සංකාරා චිත්‍රපටියෙහි සිංහල බෞද්ධ භික්ෂූන්වහන්සේට උන්වහන්සේගේ සිත දමනය කරගැනීමට නො හැකි ය. ථෙරවාද බුදුදහම අසාර්ථකය යන පණිවුඩය ඉන්දියාවේ බමුණන්ට කෙතරම් ආකර්ෂණීය වුවක් ද?

අද ද ස්ථානීය වශයෙන් ගත්කල ඉන්දියාවේ දැනුම් හා සංස්කෘතික ආධිපත්‍යය ඇත්තේ බමුණන්ට ය. ඉන් අදහස් කරන්නේ ඉන්දියාවේ විශ්වවිද්‍යාලවල, පර්යේෂණ ආයතනවල, සිනමාව සම්බන්ධ ජූරි සභාවල, ජනමාධ්‍යයෙහි ආදී වශයෙන් ඊනියා දේශීය උගතුන් හා බුද්ධිමතුන් ඇතැයි කියැවෙන ආයතනවල ඇත්තේ බමුණන් පමණක් වේ ය යන්න නො වෙයි. එහි වෙනත් වංශවල අය මෙන් ම විදේශිකයෝ ද වෙති. එසේ වුවත් ඒ දේශීය අයගේ සිත් සතන් බමුණු මතවාදවලින් පෝෂණය වෙයි. අප කැමති වුවත් අකැමැති වුවත් ඉන්දියාවේ බෞද්ධ විරෝධී ඉතිහාසයක් ඇත. අවුරුදු දහස් ගණනක් තිස්සේ දිවෙන මේ විරෝධය හුදු සංකේත මගින් නිෂ්ප්‍රභ නො වෙයි.

© Prof. Nalin De Silva

ඉන්දියාවේ ජාතික ධජයෙහි ධර්ම චක්‍රය ඇත. එහෙත් ජවහර්ලාල් නේරු මහතා ජාතික ධජයෙහි ඒ සංකේතයෙන් බලාපොරොත්තු වූ දේ එලගැන්වී ඇත් ද? නේරු මහතා සංස්කෘතික වශයෙන් ගත්කල ඉන්දියානුවකුට වඩා ඉංගිරිසි ජාතිකයෙක් විය. ඉංගිරිසින්ට හුරු වූ ආකාරයට ව්‍යාජ සංකේත මගින් අනෙක් ජනවර්ගවලට තැන දීම නේරු මහතා ද අනුගමනය කර ඇති බව පැහැදිලි ය. සංකේත මගින් බුදු දහමට තැනක් දීමට නේරු මහතා අදහස් කරන්නට ඇත. එහෙත් එවැනි සංකේතාත්මක වැදගත් බවක්වත් ඉන්දියාවේ බුදු දහමට දීමට සංස්කෘතියෙන් ඉන්දියානුවන් වූවන්ට අවශ්‍ය නො වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් ඉන්දියාවේ ප්‍රථම ජනාධිපති වූ සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් මහතා බුදුන් වහන්සේ ගැන කියා සිටියේ උන්වහන්සේ හින්දුවරයකු ලෙස ඉපිද හින්දුවරයකු ලෙස ජීවත් වී හින්දුවරයකු ලෙස මියගිය බව ය. ලංකාවේ ද ඇතැම්හු, විශේෂයෙන් ම හින්දු භක්තිකයෝ එවැනි ප්‍රකාශ කරති. බුදුදහම හෑල්ලුකරන මේ ප්‍රකාශය මුළුමනින් ම අසත්‍ය කරුණක් වන්නේ හින්දු ආගම ඉන්දියාවේ ඇතිවූයේ ම බුදුන්වහන්සේ පිරිනිවන් පෑමෙන් බොහෝ කලකට පසුව වීම හේතුවෙනි. අද බුදුදහම ඉන්දියාවේ ඊනියා පහත් කුලවල ජනයාගේ ආගම බවට පත්වී ඇත. එයට එරට වැදගත්කමක් නැත. එය ජාතික ධජයේ සංකේතයකට පමණක් සීමා වෙයි. එයට සංකේතාත්මක අගයක්වත් නැත.

ඉන්දියාවේ බුදු දහම නැත්තට ම නැතිවීමෙන් පසුව බුදුසසුන රැකගැනීම පිලිබඳ ව ලංකාව කෙරෙහි ඉන්දියාවෙහි විශේෂයෙන් ම එහි උගතුන්ගේ ඇත්තේ වෛරයකි. ඔවුන් ඒ බව කිසි දිනෙක වචනයෙන් නො කියනු ඇත. ඉන්දියාවේ (භාරතයේ) ආර්ය වෛදිකයන්ට අනාර්ය සංස්කෘතියක පැන නැගි බුදු දහම නැති කිරීමට හෑල්ලුවට ලක්කිරීමට අවශ්‍ය වීම පුදුමයක් නො වෙයි. බුදු දහමෙහි වත් පිළිවෙත් ඔස්සේ විමුක්තිය ලැබීමට නොහැකි යැයි ඔවුහු  අදහති. ඔවුන්ට එවැන්නක් කියැවෙන චිත්‍රපටියක් ලංකාවෙන් ම ලැබෙන විට ඔවුන් කෙතරම් සතුටින් ඒ පිළිගන්නේ දැයි සිතාගත හැකි ය. එවැනි චිත්‍රපටියකට සම්මානයක් දීම මගින් ඉන්දියානුවන් කරන්නේ තමන්ට ම, එනම් හින්දු සංස්කෘතියට ම ගෞරව කරගැනීමකි. අප මේ සම්මානවලින් මුලා විය යුතු නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva